ශීර්ෂය 165- ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 397.20 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 337.35 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 59.85 ක් හෙවත් සියයට 15.06 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 76.99 | 46.62 | 30.37 | 39.44 |
| මූලධන | 320.21 | 290.73 | 29.48 | 9.20 |
| **එකතුව** | **397.20** | **337.35** | **59.85** | **15.06** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 16501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 3.00 | 0.49 | 1.00 | 0.52 | 10.00 | 2.29 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0456/0016/000 දරන අග්‍රිම ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 21.03 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| (අ) පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**3.2 විගණන සාක්ෂි නොවීම**

---------------------------

කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ බෙදාහැරීම හා පෙර පාසල් උපකරණ බෙදාහැරිම සම්බන්ධයෙන් සැපයුම්කරුවන් හා ප්‍රතිලාභීන් තෝරාගත් ආකාරය පිළිබඳ තොරතුරු හා ප්‍රසම්පාදන කමිටු වාර්තාවල මුල් පිටපත් සාක්ෂි ලෙස ඉදිරිපත් නොකිරීම නිසා ගනුදෙනු 03 කට අදාළ එකතුව රු.17,129,600 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**3.3 සීමා නොපිළිපැදීම**

--------------------

අත්තිකාරම් විෂය අංක 16501 ට අදාළව පාර්ලිමේන්තුව විසින් පණවා තිබුණු අවම ලැබීම් සීමාව රු.1,000,000 ක් වුවත් සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ලැබීම් රු.520,965ක් වීම නිසා රු.479,035 කින් අවම ලැබීම් සීමාවට ළඟා වීමට කටයුතු කර නොතිබුණි.

**3.4 විසර්ජන ගිණුම**

-----------------

**අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයයන් 2ක් සඳහා සලසා තිබුණු රු.400,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයක් වෙනුවෙන් ලබාගත් රු. 19,900,000 ක පරිපූරක ප්‍රතිපාදන වලින් රු.12,669,797ක් පමණක් උපයෝජනය කර තිබෙන අතර එය එම ප්‍රතිපාදනයෙන් සියයට 63.66 ක් විය.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**අභ්‍යන්තර විගණනය**

-----------------------

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

---------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 සැප්තැම්බර් 04 දින වනවිටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.7** අනුකූල නොවීම්

------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

--------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිසංග්‍රහය**<br>මුදල් රෙගුලාසි 139 (1) | ඇල්පිටිය හා දෙනුවර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල සඳහා ලබා දි තිබූ රු.316,600 ක අත්තිකාරම් පියවීමේ වවුචර් සහතික කර නොතිබුණි. |
| (ආ) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1- දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ඡේදය 2.2 | කළමනාකරණ සහකාර තනතුරු සඳහා සේවකයින් අනියම්/ කොන්ත්‍රාත් පදනමින් බඳවාගැනීමේදී බඳවාගැනීම් පරිපාටියේ අවම සුදුසුකම් සපුරා තිබිය යුතු වුවත් සුදුසුකම් සපුරා නොතිබූ සේවකයින් දෙදෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී රු.834,694 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |

**3.8** **කාර්යසාධනය**

-----------------

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැසිජලය එකතු කිරීම සඳහා ටැංකි නිපදවීමේ ව්‍යාපෘතියේ 2016 වර්ෂයේ පළමු අදියරේදී රු.69,030,000 ක ඇස්තමේන්තුවකට ජලටැංකි 1,000 ක් නිපදවීමට සැලසුම් කර තිබුණ ද, රු.31,735,050 වැයකර නිමකර තිබුණේ ජල ටැංකි 421 ක් පමණි.

(ii) වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නල ළිං 40 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 3.48 ක් වෙන් කර තිබුණ ද, වැයකර තිබුණේ රු.680,000 ක් පමණි. ‘‘ලේකම්වරයාගේ අදහස් දැක්වීම අනුව ඇද හැලුනු ධාරානිපාත වර්ෂාව නිසා ක්‍රියාත්මක කළ නොහැකි වී තිබූ බව’’ ප්‍රකාශ කර තිබුණි.

**3.9 කළමනාකරණ ක්‍රියාකාරකම්**

අමාත්‍යාංශය පිහිටුවා ඇති ගොඩනැගිල්ලේ කුලිය සම්බන්ධයෙන් රජයේ ප්‍රධාන තක්සේරු විමසා තිබූ බවට ද, ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා පිළියෙල කල ගිවිසුම නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නිරීක්ෂණ ලබාගත් බවට ද, සාක්ෂි ඉදිරිපත් නොවුණි. තවද, වර්ග අඩි 17,576 කින් සමන්විත මහල් 04 කින් යුත් ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රු. 1,610,000 ක් ගෙවා තිබුණ ද, එහි සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව 47 දෙනෙකු පමණක් විය.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 09 | 02 |
| (ii) | තෘතියක මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතික මට්ටම | 24 | 12 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 13 | 13 | - |
| (v) | වෙනත් | 03 | - | 03 |
| | | 54 | 35 | 19 |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන සංහිඳියා කාර්යාංශය සඳහා කාර්යය පැවරුම් මත නිලධාරීන් 04 දෙනෙකු බඳවා ගෙන තිබුණි.